#mediaethicsSL #TamilPress #lka #Thinakaran #November02

ෆේස්බුක් සමාජ ජාලය ඔස්සේ සංවිධානය කොට හපුතලේ ප්‍රදේශයේ නිකේතනයක පැවැත්වුණු පුද්ගලික සාදයකදී මත්ද්‍රව්‍ය භාවිතා කිරීමේ චෝදනාව යටතේ 58 දෙනෙකු පොලිසිය මගින් අත් අඩංගුවට ගත් සිදුවීමක් තිනකරන් මගින් වාර්තා කොට ඇත. කෙසේ වෙතත් මෙම ප්‍රවෘත්ති වාර්තාව සම්බන්ධයෙන් කරුණු දෙකක් අවධානයට ගැනීමට හැක.
මෙහි සිරස්තලයේ පුද්ගලයින් 58 දෙනෙකු අත් අඩංගුවට ගත් බව සඳහන් කොට, එයට කාන්තාවක්ද අයත් බව විශේෂයෙන් සඳහන් කරන්නේ මන්ද? එසේ සඳහන් කිරීම ප්‍රවෘත්තියට අත්‍යාවශ්‍ය වේද?
එසේම අත් අඩංගුවට ගත් "සැකකරුවන්ගේ" ඡායාරූපයන්, ඔවුන්ගේ අනන්‍යතාවය හෙළිදරවු කරගත හැකි ආකාරයෙන් බොඳ කිරීමකින් හෝ තොරව පළ කරන්නේ මන්ද?